සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

2789

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම:-.......................................................... විභාග අංකයः-..........................................................

අයදුම්කරුවන්ට උපදෙස්
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

- රූප සටහන ඇසුරෙන් අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



01. මෙම රූප සටහනින් දක්වෙන ලෙන හඳුන්වන නම කුමක් ද? ..........................................................

02. එහි ඇති සිතුවම් අයත්වන යුගය නම් කරන්න. ..........................................................

03. සත්ව රූප අතරින් සොයාගත් සරල ඉරිකැබලි තුනකින් අඳින ලද මෙම සතා යැයි අනුමාන කළ හැකි, මෙහි හමුවන විශේෂ සත්ත්ව රූපය කුමක් ද? ..........................................................

04. මෙම චිත්‍ර ලංකාවේ වැදි ජනතාව විසින් අඳින ලද සිතුවම් බව පැවසුයේ කවුරුන් ද? ..........................................................
..........................................................

05. මෙවැනි ගුහා රාශියක් ලංකාවේ වෙනත් ප්‍රදේශවලින්ද හමුවී ඇත. එම ගුහා අතර ඇතා සහ ඇත් පැටවා නමැති විශේෂ සිතුවම හමුවන ගුහාව නම් කරන්න ..........................................................

- අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

06. පාලි භාෂාවෙන් "කුමුදුප්පල" ලෙස ද සිංහල භාෂාවෙන් "දිව මහනෙල්" ලෙසට ද හඳුන්වන නා ලොවට අයත් මලකි.

1. කතිරමල   2. නාරිලතා මල   3. කඩුපුල් මල   4. සීනමල

07. සරලව සතෙකු "ඇඹීම" සඳහා පහසුම මාධ්‍ය වන්නේ,

1. සබන්   2. මැටි   3. රිජිෆෝම්   4. කදුරු ලී

08. රතුපාට පසුබිමක් ඇති චිත්ත රෙද්දකට වඩාත් කැපී පෙනීම සඳහා එහි මල් සඳහා ඔබ යොදන විරුද්ධ වර්ණය වන්නේ,

1. කහ 2. දම් 3. නිල් 4. කොළ

09. හතරැස් කොටුවේ සෑම මුහුණතකම අටපෙති නෙළුම් මල් දක්වා ඇති ස්තූපය,

1. රන්කොත් වෙහෙර ස්තූපය 2. අභයගිරිය ස්තූපය

3. ජේතවන ස්තූපය 4. රුවන්වැලිසෑ ස්තූපය

10. තල්කොළ පැදුරු වර්ග කීපයකි. එයින් නිදා ගැනීම සඳහා භාවිත කරන පැදුරු වර්ගය හඳුන්වනු ලබන්නේ

1. කදිර්පායි 2. පඩුක්කෙයි පායි 3. පන්දිප්පායි 4. සොට්ටුප්පායි

- **අංක 11 සිට 15 දක්වා ඇති රූපසටහන් සඳහා අදාළ නිවැරදි පිළිතුර තෝරා එම රූප සටහන් යටින් ඇති තිත් ඉර මත ලියන්න.**

දොස්තර හොඳ හිත, පිස්සු පූසා, කුඹිච්චී, වලස්මාමා, දඟරවලිග ලප වානර, නූල් රූකඩ, රිටි රූකඩ, සෙවනැලි රූකඩ, ඇඟිලි රූකඩ, අත් රූකඩ

11. 

..........................................................

12. 

..........................................................

13. 

..........................................................

14. 

..........................................................

15. 

..........................................................

- **අංක 16 සිට 20 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් ( ✓ ) ලකුණත් වැරදි නම් ( X ) ලකුණත් ඉදිරියෙන් ඇති හිස්තැන තුළ යොදන්න.**

16. පත් පැදුරු කර්මාන්තයේ නියැලී සිටින අය පොදුවේ හඳුන්වනු ලබන්නේ "කින්නර" යන නමින්ය. ( )

17. වැහි පොද ඇති අවස්ථාවක අහසේ දක්නට ලැබෙන දේදුන්නේ ඇති "කහ" පාට සීත වර්ණයකි. ( )

18. සරල අච්චු මෝස්තර සඳහා හබරල පිත්ත ද භාවිතා කළ හැකිය ( )

19. "උත්තර චෛත්‍යය" යනුවෙන් හඳුන්වන්නේ පොළොන්නරුවේ ඇති රන්කොත් වෙහෙරටය. ( )

20. නූල් රූකඩ ශ්‍රී ලංකාවේ පාරම්පරිකව පැවත එන ජන කලාවකි. ( )

■ පහත සඳහන් රූප සටහන්වලට අදාළ ගැලපෙන නිවැරදි පිළිතුර තෝරා රූප සටහන ඉදිරියේ ඇති වරහන තුළ එම අක්ෂරය ලියන්න.

21.  (..........)

22.  (..........)

23.  (..........)

24.  (..........)

25.  (..........)

A පිවිසුම් දොරටුව අසලින් හමුවූ සංඛ නිධි හා පද්ම නිධි බහිරව රූප දෙක මෙම ස්තූපයේ හමු වූ විශිෂ්ට නිර්මාණයකි.

B සද්ධාතිස්ස රජතුමා වැඩ අවසන් කරන ලද මෙම ස්තූප මළුවේ විහාරමහා දේවියගේ පිළිරුවක්ද නිර්මාණය කර ඇත.

C ලජ්ජිතිස්ස රජතුමා විසින් මෙම ස්තූපයට වටදාගෙයක් ඉදි කළ බව සඳහන් වන අතර එය ලංකාවේ ඉදි වූ මුල් ම වටදාගෙය ලෙස ද හැඳින්වේ.

D පොළොන්නරු යුගයට අයත් මෙම ස්තූපය නිශ්ශංක මල්ල රජතුමා විසින් ඉදි කරන ලද බව සඳහන් වේ.

E ධාන්‍යාකාර හැඩයෙන් යුත් මෙම ස්තූපය "මිණි පළඟ" තැන්පත් කොට ඉදි කරන ලද බව මහාවංශයේ සඳහන් වේ.

අංක 26 සිට 30 දක්වා අසා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු හිස්තැන තුළ ලියන්න.

26. සිංහල එක් මාසයක නමින් ද හඳුන්වන, පහතරට ප්‍රදේශයේ "කිණිහිරියා නමින් ද හඳුන්වන ................................ මල උද්භිද සැරසිලි ගණයට අයත් වේ.

27. රූකඩ කැපීම සඳහා භාවිත කරන සැහැල්ලු ම ලී වර්ගය ලෙස ............................ ලී භාවිත කරයි.

28. ද්‍රව්‍ය බලා ඇඳීමේදී එළිය, අඳුර, වයනය, පරිමානය හා පරිමාව පෙන්වීම හඳුන්වනු ලබන්නේ.............................. නමින් ය.

29. පැදුරු කර්මාන්තයේදී පන් හා නියද කෙඳි වර්ණ ගැන්වීමේදී කළු පාට සාදා ගන්නේ.............................. දමා එකට තැම්බීමෙනි.

30. සරල ව්‍යුක්ත හැඩතල සහිත නිර්මාණය කරන ලද රූප පරිගණක තාක්ෂණයෙන් සජීවිකරණයට ලක් කිරීමෙන් කරනු ලබන, ළමුන්ගේ විනෝදාත්මක රූපවාහිනී වැඩ සටහන් .................................... නමින් හැඳින්වේ.

(ලකුණු 30 යි)

## II කොටස

- පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන එක් චිත්‍රයක් පමණක් ඇඳ වර්ණ කරන්න.

1. පෝයදා අපේ පන්සල
2. විනෝද ගමනක් ගොස් වැවක දිය නාමින් විනෝද වන අපි
3. අභය භූමියක නිදහසේ සැරිසරන වන සතුන්
4. සත්ව හැඩතල හෝ මල්, කොළ, ගෙඩි, ඇසුරෙන් ඔබ කැමති පරිදි චිත්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
5. හතරැස් හැඩති මේසයකට ගැලපෙන පරිදි මුළුතල මෝස්තරයක් ඔබ කැමති පරිදි නිර්මාණය කරන්න.
6. පාසලේ පවත්වන සාහිත්‍ය උත්සවය සඳහා ගැලපෙන පෝස්ටරයක් නිර්මාණය කරන්න.
7. ඔබේ හොඳම යාළුවාට යැවීම සඳහා අලුත් අවුරුදු සුභ පැතුම්පතක් නිර්මාණය කරන්න.

(ලකුණු 70)